ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම- 2010

-------------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගමේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය (6.5.1 පරිච්ඡේදය) ප්‍රකාරව, සමාගමේ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණනයට ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, 2011 අගෝස්තු 01 දිනැති කෙටුම්පත් විගණන වාර්තාව මගින් පෙන්වා දෙනු ලැබූ ගිණුම්කරණ අඩුපාඩු සඳහා ගැලපීම් කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2011 අගෝස්තු 26 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

(අ) 2010 දෙසැම්බර් 31 දිනට රු. 226,909,844 ක් වූ දේපල , පිරියත හා උපකරණ පිළිබඳ නියැදි පරීක්ෂණයේදී පහත නිරීක්ෂණයන් සිදු කෙරුණි.

(i). යාවත්කාලීන කරන ලද දේපල, , පිරියත හා උපකරණ ලේඛනයක් සමාගම විසින් පවත්වා නොතිබුණු අතර වත්කම් ආගණනයක්ද සිදුකර නොතිබුණි. එබැවින් සමාගමේ දේපල පිරියත හා උපකරණ සහ ඒ මත ක්ෂය ලෙස ගිණුම්වල දැක්වෙන ප්‍රමාණයන්ගෙන් සත්‍ය හා සාධාරණ තත්ත්වයක් දැක්වෙන්නේද යන්න පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(ii). සෑම වර්ෂයකදීම සිදු කෙරෙන ස්ථාවර වත්කම් පිළිබඳ භෞතික සත්‍යාපනයේදී අතිරික්තතා හා ඌනතා හදුනා ගැනෙන නමුත් ඒ පිළිබඳ කිසිදු ක්‍රියා මාර්ගයක් පසුගිය වර්ෂ 10 තුළ ගෙන නොතිබුණි.

(iii). සමාගම විසින් 1940 සැප්තැම්බර් 23 දින රු. 45,650 කට මිලදී ගෙන තිබු කොටහේනේ පිහිටි පර්චස් 15.87 ක් වු ඉඩම පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(iv). 99 අවුරුදු බදු පදනම යටතේ 1925 සිට 1988 දක්වා කාල පරිච්ඡේදය තුළ ලබාගෙන තිබු වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. උදා. ලේක්හවුස් ගොඩනැගිල්ල හා කතරගම සංචාරක බංගලාව

(v). යන්ත්‍රෝපකරණ සහ ලී බඩු හා කාර්යාල උකරණ ගිණුම් පිළිවෙලින් රු. 18,271 කින් හා රු. 9,909 කින් අඩුවෙන් දක්වා තබුණි.

(vi). එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ වඩුවැඩ අංශය මගින් සාදන ලද ලීබඩු අගය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) සේවකයන්ට ගෙවිය යුතු බැර ශේෂයන් හිලව් කිරිම හේතුවෙන් වෛද්‍ය රක්ෂණ ගිණුම රු.3,556,825 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) පවතනා වෛද්‍ය රක්ෂණ හිමිකම් මගින් ආවරණය නොවන වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කිර්මේ අරමුණින් 2004 නොවැම්බර් 18 දින රු.3,110,000 කින් වෛද්‍ය අරමුදලක ස්ථාපනය කරන ලදී. 2010 වර්ෂය තුළදී එය වෙනම අරමුදලක් ලෙස ගිණුම්වලට ගෙන තිබුණි. කෙසේවුවද එක්සත් පවෘත්තිපත්‍ර සමාගමේ ගිණුම්වල එය හෙළිදරව් කර නොතිබුණි. තවද 2004 වර්ෂයේ සිට 2010 දෙසැම්බර් 31 දක්වා කිසිදු ගෙවීමක් සිදුකර නොතිබුණු අතර 2010 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය රු. 5,335,942 ක් විය.

## 1.2.3 නොසැසඳු පාලන ගිණුම්

----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලෙජර ගිණුමට අනුව, ලැබීම් යටතේ දැක්වෙන මුදල් ශේෂය රු.658,386 ක් වුවද එය උපලේඛනය අනුව රු.621,000 ක් වු හෙයින් රු.37,386 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වෙළෙඳ ණයගැතියෝ ශෙෂය රු.690,718,867 ක් වු අතර මූල්‍ය ප්‍රකාශනවලට අනුව රු.699,195,942 ක් වුයෙන් රු.8,477,075 ක වෙනසක් නිරීක්ණය විය.

(ඈ) පරිගණක පද්ධතියට අනුව (Adpro System) සමාලෝචිත වර්ෂයේ අවසාන මාස දෙක සඳහා දැන්වීම් ගාස්තු ආදායම රු.635,535,376 ක් වුවද මුදල් අයකැමි විසින් පවත්වන ලද ලේඛනයට අනුව එය රු.627,276,234 ක් විය. රු.8,259,142 ක් වු වෙනස සම්බන්ධයෙන් හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

(ඈ) පරිගණක පද්ධතියට අනුව සමාලෝචිත වර්ෂයේ අවසාන මාස දෙක සඳහා දෛනික මුදල් රැස්කිරීම රු.40,236,741 ක් වු අතර, මුදල් අයකැමි විසින් පවත්වන ලද ලේඛනයට අනුව එය රු.35,080,330 ක් විය. එබැවින් රු. 5,156,411 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) 2010 දෙසැම්බර් 31 දිනට සනාථ කිරීම් සඳහා එවන ලද නියෝජිත ආදායම් ලෙජර ණයගැතියන්ගේ ලැයිස්තුවට අනුව ශේෂය රු.238,301,981 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එය රු. 233,971,501 ක් විය. ඒ අනුව රු.4,330,480 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.2.4 හඳුනා නොගත් ගිණුම්

------------------------------

2008 වර්ෂයට අදාළ රු. 982,363 ක් වු හඳුනා නොගත් තැන්පතුවක් විවිධ ණයහිමි ශේෂය තුළ ඇතුළත්ව තිබුණි. කෙසේ වුවද එය හඳුනාගැනීමෙන් හා ගිණුම්වල ගැලපීමෙන් තොරව ගිණුම්වල ඉදිරියට ගෙනැවිත් තිබුණි.

### 1.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

පහත නිරක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂයකට වැඩි කාලයක් ඉක්ම වු රු. 49,607,481 ක වෙළෙඳ ණයගැති ශේෂය වර්ෂ පහකට වැඩි කාලයක් වු රු. 19,888,610 ක වෙළෙඳ ණයගැති ශේෂය සහ වර්ෂ පහකට වැඩිකාලයක් ඉක්ම වු රු. 36,578,515 ක විවිධ ණයගැති ශේෂ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) විවිධ භාණ්ඩ හා සේවා මිලදීගැනීම වෙනුවෙන් අවස්ථා 104 කදී ලබා දෙන ලද රු.2,055,064 ක් වු අත්තිකාරම් ශේෂයන් 2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ දෙකකට වැඩි කාලයක් හිඟව පැවතුණි.

(ඇ) ණය පදනම මත ලබාදෙන ලද පුවත්පත් මුද්‍රණවලට අදාළව මුද්‍රණ ආයතනකින් ලැබිය යුත රු.20,460,395 ක් 2010 දෙසැම්බර් 31 දිනට මාස 8 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ඇ) භාණ්ඩ හුවමාරු පදනම මත 2010 ජනවාරි හා පෙබරවාරි මාස වලදී කිලෝග්‍රෑම් 199,798 ක් වූ මුද්‍රණ කඩදාසි ලක්බිම සමාගමට ලබාදී තිබුණද 2010 දෙසැම්බර් 31 දක්වා එයින් ආපසු ලබාදී තිබුණේ කිලෝ ග්‍රෑම් 104,388 ක් පමණි. ඒ අනුව රු. 6,821,487 ක් වටිනා මුද්‍රණ කඩදාසි කිලෝග්‍රෑම් 95,410 ක් ආපසු ලැබී නොතිබුණි.

(ඉ) 2010 දෙසැම්බර් 31 දිනට රු.30,263,267 ක් වූ ණය ශේෂයෙන් රු.1,471,287 ක් වර්ෂ දෙකකට වැඩි කාලයක සිට පරිශේෂව පැවතුණි. එසේ වුවද මෙම ශේෂ නිරවුල් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාගම විසින් අනියම් පදනම මත යොදවා සිටි කැන්වසර්කරුවන්ගෙන් වර්ෂ 8 ක වැඩි කාලයක සිට අයවිය යුතු රු.2,185,197 ක මුදලක් අයකර ගෙන නොතිබුණි.

(උ) ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් අයකරගත යුතු රු.5,432,000 ක මුදලක් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර ගෙන නොතිබුණි.

(ඌ) නියං සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2004 වර්ෂයේදී නිලධාරියෙකුට රු.250,000 ක මුදලක් ලබාදී තිබුණි. එම නිලධාරියා තවදුරටත් සමාගමේ සේවයේ යෙදී සිටින නමුත් 2010 දෙසැම්බර් 31 දක්වා එම අත්තිකාරම පියවා නොතිබුණි.

1.2.6 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

ගිණුම්වල දැක්වෙන පහත සඳහන් විෂයයන් එම එක් එක් විෂය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| බැංකු ශේෂ හතක් | 2,503,771 | සනාථ කිරීම් |
| කළමනාකරණ වැටුප් සකස්කිරීම සඳහා පෞද්ගලික ආයතනයකට කරන ලද ගෙවීම | 169,831 | අදාළ ටෙන්ඩර් ලිපිගොනුව |
| විවිධ ණයගැතියන් | 12,155,658 | ඉන්වොයිසි සහ ජර්නල් වවුචර් |
| ආයෝජන | 103,000 | කොටස් සහතිකවල මුල් පිටපත් |
| වෙළඳ ණයගැතියන් | 380,705,161 | සනාථ කිරීම් |
| | ---------------- | |
| | 395,637,421 | |
| | ========= | |

1.2.7 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-------------------------------------------------------

1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

-------------------------------------

2.1 **මූල්‍ය සමාලෝචනය**

----------------------

2.1.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද සංශෝධිත මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු.359,781,998 ක බදු පූර්ව ශුද්ධ අලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු.82,354,674 ක් වූ හෙයින් මූල්‍ය ප්‍රතිඵලයේ රු.442,136,672 ක පිරිහීමක් දැක්වුණි. රු.291,990,035 කින් වියදම් වැඩිවීම හා රු.150,146,637 කින් ආදායම් අඩුවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන හේතු විය. සවෙච්ජා විශ්‍රාම යෝජනා ක්‍රමය යටතේ වියදම් සඳහා රු.168,708,949 ක මුදලක් වැය කිරීම මුළු වියදම වැඩිවීමට ප්‍රධාන හේතුව විය.

2.1.2 **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

----------------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ දළ ලාභ ආන්තිකය හා ලාභ සැදහුම් මිළ (profit mark up) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී පිළිවෙලින් 4.32% කින් හා 15.46% කින් අඩුවී තිබුණු අතර ස්වෙච්ජා විශ්‍රාම ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ පිරිවැය රු. මිලියන 169 කින් වැඩිවී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඉකුත් වර්ෂයේ වූ බදු පෙර ශුද්ධ ලාභය සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 360 ක බදු පෙර ශුද්ධ පාඩුවකට පරිවර්තනය වී තිබුණි. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනයේදී අනාවරණය වූ කරුණු කිහිපයක් ඉකුත් වර්ෂය සමඟ සසදා පහත දැක්වේ.

| | | 2010 | 2009 |
|---|---|---|---|
| i. | දළ ලාභ ආන්තිකය | 44.97% | 49.29% |
| ii. | ලාභ සැදහුම් මිළ (විකුණුම් පිරිවැය මත දළ ලාභය) | 81.74% | 97.2% |
| iii. | පිරිවැටුම මත පරිපාලන පිරිවැය | 41.93% | 39.95% |
| iv. | පිරිවැටුම මත විකුණුම් හා බෙදාහැරීම් පිරිවැය | 10.16% | 10.96% |
| v. | පිරිවැටුම මත මූල්‍ය පිරිවැය | 2.25% | 4.05% |
| vi. | ද්‍රවශීලතා අනුපාතය | 1.46:1:00 | 2.32:1.00 |

(ආ) ලාභය හා පාඩුව

2010 වර්ෂය සඳහා ශුද්ධ පාඩුව ඉකුත් වර්ෂ සමඟ සසඳා පහත දැක්වේ.

| වර්ෂය | බදුපෙර ශුද්ධ ලාභය/(පාඩුව) |
|---|---|
| | රු. |
| 2007 | 31,920,326 |
| 2008 | (385,505,785) |
| 2009 | 82,354,674 |
| 2010 | (359,781,998) |

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

### 2.2.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පෙර වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂය තුළදීද සමාගම විසින් පුවත්පත් 6 ක් වාර සඟරා 7 ක් සහ වාර්ෂික ප්‍රකාශන 11 ක් ප්‍රසද්ධ කර තිබුණි. පුවත්පත්වල , වාර සඟරාවල හා වාර්ෂික ප්‍රකාශනවල ශුද්ධ දායකය සමාලෝචිත වර්ෂය තුළදී රු. 76,274,213 කින් අඩු වී තිබුණි.

(ආ) සමාගම විසින් ප්‍රසිද්ධ කරන ලද පුවත්පත් 6 කින් සමාගමේ මූල්‍ය ප්‍රතිඵලයට හිතකර දායකත්වයක් ලබා දී තිබුණ. විස්තර පහත පරිදිවේ.

i. සමාගමේ පුවත්පත්වල සමස්ථ දැන්වීම් ආදායම ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී රු.89,518,560 කින් එනම් 4.7% කින් වැඩිවී තිබුණි.

ii. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාගමේ සමස්ථ පුවත්පත් විකුණුම් ආදායම රු.42,362,064 කින් එනම් 8.19% කින් අඩුවී තිබුණි.

### 2.2.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය

සීමාසහිත ලේක්හවුස් ප්‍රොපටි ඩිවෙල්ප්මන්ට් සමාගමේ 1985 වර්ෂයේදී කරන ලද රු.7,500,000 ක ආයෝජනයෙන් සමාලෝචිත වර්ෂය දක්වා කිසිදු ආදායමක් ලැබී නොතිබුණි.

### 2.2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

සමාගමේ අතිරික්ත සේවක සංඛ්‍යාව අඩුකිරීම සඳහා 2008 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමයක් (VRS) ක්‍රියාත්මක කර තිබුණි. ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමය යටතේ සේවකයන් 839 ක් විශ්‍රාම ලබා තිබුණද යෝජනා ක්‍රමය හඳුන්වා දීමෙන් පසු සේවකයන් 194 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

| වර්ෂය | විශ්‍රාම ලැබූ සේවක සංඛ්‍යාව | ස්වෙච්ඡා, විශ්‍රාම යෝජනා ක්‍රමයට ගෙවන ලද මුදල |
|---|---|---|
| | | රු |
| 2008 | 635 | 518,330,473 |
| | - | 3,229,257 |
| 2010 | 204 | 172,007,306 |
| එකතුව | 839 | 693,567,036 |

| | <u>බඳවාගනු ලැබූ සේවක සංඛ්‍යාව</u> |
|---|---|
| ස්ථිර කාර්ය මණ්ඩලය | 37 |
| කොන්ත්‍රාත් පදනම මත | 75 |
| කොන්ත්‍රාත් පදනම මත නැවත පත්කිරීම | 82 |
| | 194 |

### 2.2.4 මුදල් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලංකා බැංකුවේ පවත්වා තිබුණු ප්‍රධාන බැංකු ගිණුමේ 2010 දෙසැම්බර් 31 දිනට රු.481,355 ක උපලබ්ධි නොවූ මුදල් ඇණවුම් පැවති බවත්, එයින් රු. 228,041 ක මුදලක් මාස 6 කට වැඩි කාලයක් හිඟව පැවති බවත් අනාවරණය විය.

(ආ) එකතුව රු. 2,026,467 ක් වූ අහරු චෙක්පත් 71 ක් පිළිබඳව විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මෙම චෙක්පත් වලින් රු.939,150 ක් වටිනාකම වූ චෙක්පත් 26 ක් වර්ෂයකට වැඩි කාලයක සිට පරිශේෂව පැවතුණි.

### 2.2.5 <u>සමාගමේ සම්පත් වෙනත් ආයතනවලට ලබාදීම</u>

සමාගමේ වාහන තුනක් සහ කුලී පදනම ලබාගත් වෙනත් වාහන තුනක් වෙනත් රජයේ ආයතන වෙත මුදාහැර තිබුණු අතර එම මෝටර් වාහනවල කුලී ගාස්තු වියදම වූ රු.1,650,000 ක් සමාගම විසින් ගෙවා තිබුණි.

2.2.6 **වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වටිනාකම රු.797,779 ක් වු ජායාරූප උපකරණ 66 ක් නිශ්කාර්ය සහ ඌන උපයෝජිත වත්කම් ලෙස හදුනා ගෙන තිබුණි.

(ආ) 2010 පෙබරවාරි මාසයේදී ආනයනය කරන ලද රු. 6,951,913 ක් වටිනාකම වු මුද්‍රණ කඩදාසි රිල් 238 ක් තිබියදීත්, 2010 ජුලි 14 දින එකක් එජඩෝ 770 බැගින් , රු.26,062,634 ක පිරිවැයකට මුද්‍රණ කඩදාසි රිල් 574 ක් මිලදී ගෙන තිබුණි. පෙර තොග එසේම තබුණද, පසුව මිලදීගත් මුද්‍රණ කඩදාසි තොගය භාවිතයට ගෙන තිබුණි. ඒ හේතුවෙන් මුද්‍රණ කඩදාසි රිල් 238 ක් වර්ෂයකට වැඩිකාලයක් භාවිතයට ගැනීමෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

2.2.7 **හදුනාගන්නා ලද පාඩු**

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුද්‍රණ කඩදාසි (GSM 45 ) මෙට්රික් ටොන් 1407 ක් 2010 පෙබරවාරි 24 දිනැති ණයවර ලිපියක් මගින් විදේශීය සමාගමකින් මිලදීගෙන තිබුණු අතර එම මුද්‍රණ කඩදාසි ඉදිරිපත් කරන ලද සාම්පලවලට අනුකූල නොවීය.

තවද සිදු වු හානිය වෙනුවෙන් ඉහත සමාගමෙන් රු.500,000 ක දඩ මුදලක් අයකර ගැනීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. එසේ වුවද රු.300,000 ක මුදලක් පමණක් එම සමාගම විසින් 2011 ජනවාරි 10 දින ගෙවා තිබුණි.

(ආ) තක්සේරු වටිනාකම රු.2,395,000 ක් වු ලොරි රථ 4 ක් රු.2,135,521 කට විකුණා තිබු අතර සමාගමට සිදු වු අලාභය රු.259,479 ක් විය.

(ඇ) මුද්‍රණ කඩදාසි පරිභෝජන ලේඛනයට අනුව, 2010 දෙසැම්බර් 31 දිනට රු.11,479,829 ක් වටිනා කිලෝග්‍රෑම් 139,526 ක් වු මුද්‍රණ කඩදාසි හානිවීම හේතුවෙන් භාවිතයට ගෙන නොතිබුණි.

(ඈ) පාසැල් පොල් මුද්‍රණය කිරීම ප්‍රමාදවීමට අදාළව දඩ මුදල් වශයෙන් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට රු.2,021,204 ක මුදලක් ගෙවා තිබුණි.

### 2.2.8 වාහන උපයෝජනය

------------------------

සමාගමේ වාහන ඇණිය සම්බන්ධයෙන් වැදගත් දත්ත කිහිපයක් සහ සමාලෝචිත වර්ෂය තුළ ඒ සම්බන්ධිත වියදම් පහත දැක්වේ.

| | |
|---|---|
| අයිතිය සතු වාහන සංඛ්‍යාව | 82 |
| කුලියට ගත් වාහන සංඛ්‍යාව | 26 |
| ඉන්ධන සඳහා දරන ලද මුළු වියදම | රු.37,774,139 |
| අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු සඳහා දරන ලද මුළු වියදම | රු.17,566,615 |

### 2.2.9 අයවැය ලේඛනමය පාලනය

----------------------------------

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණයන් වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණ.

## 3. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) ලැබිය යුතු ශේෂ අයකර ගැනීම
(ආ) ප්‍රසම්පාදන
(ඇ) මෝටර් වාහන අපහරණය
(ඈ) සේවක ණය හා අත්තිකාරම්
(ඉ) පුවත්පත් නියෝජිතයන්ගේ තැන්පතු හා අයකරගැනීම්
(ඊ) තොග
(උ) වත්කම්